# සිංහල පරිවර්තනය

2015-09-17

අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා,

ජනාධිපති,

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජය

අතිගරු ජනාධිපතිතුමනි,

2015 සැප්තැම්බර් මස 16 වන දින ජිනීවා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ මහ කොමසාරිස් සේයිඩ් රාඩ් අල් හුසේන් කුමරු විසින් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයට ඉදිරිපත් කරන ලද යෝජිත යාන්ත්‍රණය ඇතුළත් ශ්‍රී ලංකාව පිළිබඳ මානව හිමිකම් මහ කොමසාරිස් කාර්යාලයේ විමර්ෂණ වාර්තාව සම්බන්ධයෙන් අපගේ විශේෂ අවධානය යොමු කරවමින් පහත අත්සන් සහිතව මෙම පෙත්සම ඔබතුමාට ඉදිරිපත් කරමු.

ශ්‍රී ලංකාවේ සන්නද්ධ අරගලයේ අවසාන අදියරේදී අතුරුදහන්වූවන් පිළිබඳ සොයා බැලීම සඳහා පත් කළ ජනාධිපති කොමිසමේ දෙවන මැන්ඩේටයේදී ශ්‍රීමත් ඩෙස්මන්ඩ් ද සිල්වා ප්‍රමුඛ ජාත්‍යන්තර නීති හා යුධ විශේෂඥයින් ප්‍රමුඛ කර ගත් කමිටුව විසින් සිදු කළ විශ්ලෙෂණයෙන් අනතුරුව ගිවිසගත් පරිදි 2015 අගෝස්තු මස 15 දින පරණගම කොමිසම් වාර්තාව ප්‍රකාශයට පත්විය. මෙහිදී කුතුහලය දනවන කාරණය වන්නේ මෙම වාර්තාව එක්සත් ජාතික මානව හිමිකම් කොමිසමට සලකා බැලීම සඳහා අවස්ථාව තවමත් නොලැබී තිබීමය.

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසම් වාර්තාවෙහි ඡේද දෙකක් වෙත ඔබතුමාගේ අවධානය යොමු කරවීමට අපි කැමැත්තෙමු. එක්සත් ජාතක මානව හිමිකම් කොමිසමෙහි සාමාජිකයින් ද ශ්‍රී ලංකාවේ සන්නද්ධ අරගලයේ අවසාන අදියරේදී දෙපාර්ශවයම විසින් සිදු කළැයි කියන බරපතල මානව හිමිකම් උල්ලංඝනයන් සහ අපරාධ සම්බන්ධයෙන් විෂ්ලේෂණාත්මක විමර්ෂණයක් සිදු කළ පරණගම කොමිසමේ දෙවන මැන්ඩේටය මත සැකසූ වාර්තාව තවමත් ඔවුන්ගේ අධ්‍යයනයට නොලැබී තිබීම ගැන කණගාටුවට පත් වී ඇත. 2015 සැප්තැම්බර් 11 වන දින නිකුත් වූ ශ්‍රී ලංකා රජය පාර්ශවයට ඉදිරිපත් කර තිබෙන සංස්කරණය නොකල වාර්තාවේ ඉහත සඳහන් කළ ඡේද දෙක මෙසේය:

> ''Following signals of engagement by the newly elected Government of Sri Lanka in January 2015, and the possibility that further information might become available for the investigation, the Human Rights Council accepted the High Commissioner's recommendation to defer consideration of the report until the 30th session.''
>
> ''61. At time of writing there were indications that the Presidential Commission to Investigate into Complaints regarding Missing

> Persons appointed by the previous Government had received a further extension to complete its work, despite widespread concerns raised about its credibility and effectiveness. **The international advisory council appointed by the previous Government to support the Commission on the second, expanded mandate it had been given to investigate alleged violations in the final stage of the conflict, has not been extended but is believed to have submitted its report.** In June 2015, two additional Commissioners were appointed to expedite the hearing of cases. In July 2015, the Government also announced the appointment of a special investigation team to expedite investigation into some cases, although its status in not known.''

ඉහත ඡේදයන් සලකා බැලීමේදී, ජිනීවාහි මානව අයිතිවාසික්ම් කොමසාරිස් වාර්තාවට අනුව ඉතා පැහැදිලිව ශ්‍රී ලංකාවේ 'ජනාධිපති විමර්ෂන කොමිසම' විසින් අතුරුදහන් වූවන් පිළිබඳ පැමිණිලි විභාග කිරීමෙන් පසු, පරණගම කොමිසන් වාර්තාව ප්‍රකාශයට පත් වීම අපේක්ෂාවෙන් සිටී.

මෙහිදී ඉතාමත් කුතුහලය දනවන කාරණය වන්නේ, පසුගිය සැප්තැම්බර් මස 16 වන දින ප්‍රසිද්ධ කළ මානව අයිතිවාසිකම් කොමිසමේ වාර්තාවෙහි අවසාන සංස්කරණය තුළ, ශ්‍රී ලංකාවේ පසුගිය රජය විසින් පත්කළ අන්තර්ජාතික විශේෂඥ උපදේශක කමිටුව පිළිබඳ පෙර ඇතුළත් කර තිබූ විස්තරය මින් ඉවත් කර තිබීමයි. එහිදී මෙය පරිශීලනය කරන්නන්ගෙන්, විශේෂඥ අන්තර්ජාතික උපදේශ කමිටුවේ උපදේශකයින් පිළිබඳ මූලාශ්‍ර සහ කරුණු සඟවා තැබීමට උත්සාහ කර තිබෙන බවක් පෙනේ. අතිගරු ජනපතිතුමනි, අප මින් අපේක්ෂා කරනුයේ මේ පිළිබඳව ඉතා ඉක්මන් පරීක්ෂණයක් සිදු කර එක්සත් ජාතික මානව හිමිකම් කවුන්සිලයේ වාර්තාවෙන් අපගේ විශේෂඥ කමිටුව පිළිබඳ පෙර අන්තර්ගතව තිබූ විස්තරය අවසාන සංස්කරණයේදී ඉවත් කිරීමට කටයුතු කළ වගකිව යුත්තා කවුරුන්ද? යන්න සොයා බැලිය යුතුය යන්නය.

අතිගරු ජනාධිපතිතුමනි, ඔබතුමා දන්නා පරිදි පසුගිය ආණ්ඩුව සමයේදී ජනාධිපති විමර්ෂන කොමිසම පත් කළ අතර ජාත්‍යන්තර ප්‍රජාව ඉදිරියේ විශ්වසනීය දේශීය විමර්ෂන ක්‍රියාවලියක් සිදු කළ යුතු වූ බැවින් 2014 ජූලි 15 වන දින කොමිසමෙහි මැන්ඩේට් පත්‍රයේ විෂය පථය පුළුල් කල අතර යුධ අපරාධ සහ මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ සම්බන්ධයෙන් ජනාධිපති කොමිසමට අවශ්‍ය විශේෂඥ සහාය ලබා ගැනීම සඳහා ජාත්‍යන්තරික කීර්තිමත් නීති - යුධ විශේෂඥයින් වන ශ්‍රීමත් ඩෙස්මන්ඩ් ද සිල්වා, මහාචාර්ය ඩේවිඩ් කාර්නේ, ශ්‍රීමත් ජෙෆ්රි නයිස් සහ එස්. එස්. ඒ හි හිටපු අණදෙන නිළධාරී වූ මේජර් ජෙනරාල් ජෝන් හොල්මීස් යන්නන්ගෙන්, අන්තර්ජාතික මානුෂික නීතිය, අන්තර්ජාතික ව්‍යවහාරික නීතිය සහ සන්නද්ධ ගැටුම් පිළිබඳ නීතිය සම්බන්ධයෙන් විශේෂඥ සහාය ලබා ගන්නා ලදී.

පරණගම කොමිසමේ දෙවන මැන්ඩේටයෙන් අපේක්ෂා කළේ ශ්‍රී ලංකාවේ ආයුධ සන්නද්ධ අරගලයේ අවසාන අදියරේදී සිවිල් වැසියන්ගේ ජීවිත අහිමි වීම් වලට ප්‍රධාන වශයෙන් බලපෑ සාධක සහ එම වටපිටාව විමර්ෂණය කර මෙම ගැටලුව සම්බන්ධයෙන් වාර්තාවක් 2015 අගෝස්තු 15 දින හෝ ඊට පෙර නිකුත් කිරීමයි. එහිදී අන්තර්ජාතික අපරාධ අධිකරණයේ ප්‍රධාන අභිචෝදකයින් ලෙස ශ්‍රීමත් ඩෙස්මන්ඩ් ද සිල්වා සහ මහාචාර්ය ඩේවිඩ් කාර්නේ යන දෙපළම කටයුතු කළහ. මෙම කාර්යභාරය ඉටු කිරීම උදෙසා එක්සත් ජාතීන්ගේ මහලේකම් විසින් මෙම දෙපළ පෞද්ගලිකව

තෝරා මහලේකම්වරයා යටතේ කටයුතු කිරීමට පත්කරගෙන තිබුණි. යුගොස්ලෝවියාවේ හිටපු ජනපති ස්ලොබෝදාන් මිලසොවිච්ට එරෙහි නඩුවේ ප්‍රධාන අභිචෝදක වූවේ ශ්‍රීමත් ජෙෆ්රි නයිස්ය. ඇත්තවශයෙන්ම, ඉහත සඳහන් කළ අභිචෝදකයින් තිදෙනාම අභිචෝදනාවට ලක් කළේ 'රාජ්‍ය නායකයින්' වීම නොසලකා හැරිය නොහැකිය. ශ්‍රීමත් ඩෙස්මන්ඩ් ද සිල්වා අභිචෝදනා ඉදිරිපත් කර හිටපු ලිබියානු ජනාධිපතිවරයෙකු වූ චාර්ලස් ටේලර් යුධ අපරාධ සම්බන්ධයෙන් වැරදි කරුවකු කර වසර 50 ක සිර දඬුවම් පැනවූ අතර ඔහු දැනටත් සිරගතව සිටී.

මේ අනුව ස්වාධීන අන්තර්ජාතික නීති සහ යුධමය විශේෂඥයින්ගේ සහාය සහිතව සකස් කළ ශ්‍රී ලංකා ආණ්ඩුවේ ප්‍රථම නිලමය වාර්තාව වන පරණගම වාර්තාවේ දෙවන මැන්ඩේට පත්‍රය දැනට අඛණ්ඩව ජිනීවාහි දිවෙන මානව අයිතිවාසිකම් කවුන්සිලයට වහාම සභාගත කිරීම අත්‍යාවශ්‍ය වන අතර එමඟින් එය ඉතාමත් සාර්ථක ප්‍රතිපල අත්කර දෙනු ඇත. මානව හිමිකම් කවුන්සිලය අවසාන විනිශ්චයකට යාමට පෙර ශ්‍රී ලංකාවේ දේශීය සහ ස්වාධීන වූ මෙම වාර්තාව ඡන්දය ප්‍රකාශ කිරීමේ බලය සහිත රටවල් 47 ක සාමාජිකයින්ට කියවීමට සහ එය ඔවුන්ට ධාරණය කර ගැනීමට අවස්ථාවක් ලබා දීම කළ යුත්තකි.

මෙහි අත්සන් තබා තිබෙන පෙත්සම්කරුවන් වන අපි විදේශ කටයුතු අමාත්‍ය විසින් නිකුත් කර තිබෙන ප්‍රකාශන සහ මාධ්‍ය වාර්තාවන්ට දැඩි ලෙස අවධානය යොමු කළෙමු. පරණගම කොමිසමේ දෙවන මැන්ඩේටය සමඟ ගැටගැසුනු මෙම ඉතා වැදගත් වාර්තාව මීට මසකට පෙර ඔබ වෙත ලබා දී තිබුනද 2015 සැප්තැම්බර් 14 දින ආරම්භ කළ එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් කවුන්සිලයේ සැසියට තවමත් ඉදිරිපත් කර නොමැත.

ජිනීවා සැසිය සාර්ථකව අවසන් කිරීමට ප්‍රථමයෙන් මෙම වාර්ථාව නිකුත් කිරීම ප්‍රමාධ කිරීමේ යෙදී සිටිය කිසියම් කණ්ඩායමක බලපෑමට නතුව ලංකාවේ වර්තමාන ආණ්ඩුව කටයුතු කරන්නේ නම්, දරුස්මාන් වාර්තාවේ අන්තර්ගත සන්නද්ධ අරගලයේ අවසාන අදියරේදී සිවිල් වැසියන් 40,000 ක් පමණ මරණ සම්බන්ධයෙන් ඇති අවිනිශ්චිත මතය අභියෝගයකට ලක් නොවී, නොබිඳී සභාගත වනු ඇත.

ඒ හරහා ශ්‍රී ලංකා රජය විසින් මෙම වාර්තාව තවදුරටත් ලඟ තබා ගැනීම හේතුවෙන් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමට වාර්ථාව සලකා බැලීමට ඉඩ ප්‍රස්තාව ඇහිරී තිබේ.

එමනිසා, යහපාලනය සහ විනිවිධභාවය කෙරෙහි උනන්දු පහත අත්සන් තබා ඇති අපි, දරුස්මාන් මණ්ඩලය විසින් සිදු කරන ලද චෝදනා අධ්‍යයනය කිරීමෙන් අනතුරුව ඉහත කී සම්භාව්‍ය විශේෂඥයින්ගේ සහාය ඇතිව නිම කළ ඉතා වැදගත් පරණගම වාර්ථාව, මෙම සතියේ ජිනීවාහි මානව අයිතිවාසිකම් කවුන්සිලයට ඉදිරිපත් කර නොතිබීම ගැන දැඩි අවධානයක් යොමු කර තිබේ.

අතිගරු ජනාධිපතිතුමනි, මෙහි පහත අත්සන් තැබූ අපි ඉල්ලා සිටින්නේ මෙම සතියේ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් සැසියට පරණගම කොමිසමේ දෙවන මැන්ඩේටය අනුව පිළියෙළ කරන ලද වාර්තාව වහාම ඉදිරිපත් කරන ලෙස විදේශ කටයුතු අමාත්‍යවරයාට උපදෙස් ලබා දෙන ලෙසයි. ඒ සමඟම එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ සාමාජිකත්වය දරණ සාමාජිකයින් 47 දෙනා අතර පමණක් නොව, ජිනීවාහි එක්සත් ජාතීන් නියෝජනය කරන රටවල් 193 ක සාමාජිකයින් අතර ද සියලුම රාජ්‍ය නොවන සංවිධාන සහ ජිනීවාහි එක්සත් ජාතීන්ගේ මාවන හිමිකම් කවුන්සිලයේ සැසීන්ට සහභාගි වන ජාත්‍යන්තර මාධ්‍ය සහ බුද්ධි මණ්ඩල ඇතුළු සියලුම ජාත්‍යන්තර සංවිධාන අතර ද මෙම වාර්තාවේ පිටපත් බෙදා හැරිය යුතුය.

එමෙන්ම, අතිගරු ජනාධිපතිතුමනි, ජිනීවාහි අවසන් තීරණය ශ්‍රී ලාංකික පුරවැසියන්ට දැඩි බලපෑමක් ඇති කරන අතර සන්හිඳියාව දෙසට යන ගමනේදී මෙරට සමකාලීන ඉතිහාසයේ පැතිකඩක්

නිරූපනය කරන මෙම පරණගම වාර්තාව ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු සාමාජිකයින් සහ රටේ පොදු ජනතාවට පරිශීලනයට අවස්ථාව ලබා දිය යුතුය. මක්නිසාදයත් 2015 සැප්තැම්බර් 16 වැනි බදාදා සවස 2.00 න් පසු OHCHR විසින් සකස් කල වාර්තාව පරිශීලනයේ හැකියාව සියල්ලට උදාවී තිබෙන බැවිනි.

ඔබතුමා දැනටමත් දන්නා පරිදි, පරණගම වාර්තාව සකස් කිරීමට විශේෂඥ සහාය ලබා දුන් ශ්‍රීමත් ඩෙස්මන්ඩ් ද සිල්වා සහ ජාත්‍යන්තර උපදේශක කමිටුව විසින් එහි වාර්තාව ප්‍රකාශයට පත් කිරීමට දින දහයකට පෙර ශ්‍රීමත් ඩෙස්මන්ඩ් ද සිල්වා තනතුරින් පහ කිරීමට සහ උපදේශක කමිටුව විසුරුවා හැරීමේ අරමුණින් 2015 අගෝස්තු 04 වන දින එක්තරා කණ්ඩායමක් විසින් අත්සන් කරන ලද පෙත්සමක් ඔබතුමාට භාරදී ඔබතුමාගේ තීරණයට බලපෑම් එල්ල කිරීමට කටයුතු කර ඇත.

අතිගරු ජනාධිපතිතුමනි, මෙහිදී විශේෂයෙන් සැළකිය යුතු කරුණ වන්නේ පරණගම වාර්තාව ප්‍රකාශයට පත් කිරීමට පෙර එය නිෂ්ප්‍රභ කිරීමේ ඍජු අරමුණින් මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් සේයිඩ් රාඩ් අල් හුසේන් කුමරුන්ට සහ (The United Nations Special Rapporteur on Truth, Justice, Reparations and Guarantees of Non-Recurrence) පැබ්ලෝ ද ග්‍රිෆ් මහතා වෙත ඉහත කී පෙත්සමෙහි පිටපත් භාර දී තිබේ. එසේම මෙම පෙත්සම තුළ ශ්‍රීමත් ඩෙස්මන්ඩ් ද සිල්වා මැතිතුමාට එරෙහිව විශේෂ පැමිණිල්ලක් එංගලන්තයේ නීතිඥවරුන්ගේ මණ්ඩලයකට සලකා බලන ලෙස විශේෂ ඉල්ලීමක් කර තිබේ.

මෙහි ඇති අදෘශ්‍යමාන සත්‍ය නම්, ශ්‍රී ලංකාවට එරෙහිව එංගලන්තයේදී පැමිණිලි පාර්ශවය වන යස්මින් සූකා මිය වනාහී දරුස්මාන් වාර්තාවේ සම-කතෘ සහ ශ්‍රී ලංකාවේ සාමය සහ යුක්තිය උදෙසා ව්‍යාපාරයේ විධායක අධ්‍යක්ෂකවරියද වී සිටීමයි.

ශ්‍රී ලංකාව අභ්‍යන්තරයේදී, ටී.එන්.ඒ. පාර්ලිමේන්තු මන්ත්‍රී එම්.ඒ. සුමන්තිරන් මහතා ශ්‍රීමත් ඩෙස්මන්ඩ් ද සිල්වාගේ වෘත්තීයභාවයට සහ ජාත්‍යන්තර කමිටුවට එරෙහිව 2015 මාර්තු 17 වන දින පාර්ලිමේන්තුවේදී ශ්‍රී ලංකා රජය විසින්ම එංගලන්තයේ නීතිඥවරුන්ගේ මණ්ඩල සන්සදයට පැමිණිලි කරවීමට මූලිකත්වය ගෙන කටයුතු කර තිබේ. ජනපතිතුමනි, ඔබතුමාගේ රජය පොළඹවා සිදුකර ගැනීමට අපොහොසත් වූ සුමන්දිරන් මහතාගේ ප්‍රයත්නය යසුමින් සූකා සිය පැමිණිල්ල තුළින් මනාව සිදු කර තිබේ. මෙම පැමිණිල්ල භාවිත කරමින් විවිධ දේශීය සිවිල් සමාජ කණ්ඩායම් අවසන් මොහොතේ පරණගම කොමිසමේ දෙවන මැන්ඩේට වාර්තාව ප්‍රකාශයට පත් කිරීම කඩාකප්පල් කිරීමට 2015 අගෝස්තු 04 වන දින බාර දුන් පෙත්සම මඟින් කටයුතු කර තිබේ.

මෙහිදී අපට පෙනෙන්නට තිබෙන කාරණය නම් බෙදුම්වාදී කණ්ඩායම්, යම් පුද්ගලයින් සහ පුද්ගල කණ්ඩායම් ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය කෙළෙසීමට සහ ලංකාව 'ජනඝාතක' රටක් ලෙසට හන්වඩු ගැසීමට පරණගම වාර්තාව එක්සත් ජාතීන්ගේ මනව හිමිකම් කවුන්සිය වෙත ඉදිරිපත් කිරීම වළක්වාලීම සඳහා කටයුතු කරමින් සිටී යන්නයි. එසේම, එකී පිරිසගේ දැඩි දෝෂදර්ශණයට හේතුව වී ඇත්තේ, ඉතාමත් විශ්වාසනීය මූලාශ්‍ර වලින් තොරතුරු එක්රැස්කර කීර්තිමත් ජාත්‍යන්තර වශයෙන් විශේෂඥ කමිටුවක් විසින් පරණගම වාර්ථාව සකසා තිබීමයි.

මේ අනුව අභිනවයෙන් පත්වුනු ශ්‍රී ලංකා රජයේ කාර්යභාරය සහ වගකීම වන්නේ, රටේ සාමය සහ සන්හිඳියාව ඇති කිරීම සඳහා සියලුම පාර්ශවයන්ට පිළිගත හැකි සාධාරණ විශ්වාසවන්ත විසඳුමක් ලබාදීමට, යහපාලන මූලධර්ම රකිමින් සහ විනිවිදභාවයෙන් යුතුව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය වෙත හා පොදු ජනයාට සහ ජාත්‍යන්තර ප්‍රජාවට පරණගම වාර්තාව ඇතුලු සියලුම වාර්තා පරිශිලනයට අවස්ථාව ලබා දීමයි.

ජනපතිතුමනි, කලින් යෝජනා වූ පරිදි ඔබතුමා ජනවාරි මාසයේදී බලයට පත්වීමෙන් අනතුරුව වැදගත් තොරතුරු අන්තර්ගත උඩලගම කොමිසන් වාර්තාව දැන් ජනගත කළ යුතුය. පසුගිය රජය විසින් ප්‍රකාශයට පත් නොකළ කරුණු ඇතුළත් එම වාර්තාව මාස අටක (08) කාලයක් ගෙවී ගියද වර්තමාන රජයෙන් ද ප්‍රකාශයට පත් කිරීම වලක්වා තිබේ. විනිවිදභාවය උදෙසා සහ සර්වසාධාරණත්වය සඳහා මෙම සියලුම වාර්තා ශ්‍රී ලාංකික ජනතාවටත්, ජාත්‍යන්තර ප්‍රජාවටත් පරිශීලනයට ඉඩ ප්‍රස්ථා වහාම ලබාදිය යුතු බව දන්වා සිටිමු.

එනම්, සමස්ත ශ්‍රී ලාංකිකයින්ට පොදුවේ බලපානු ලබන එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුනසිලයේ අවසන් තීරණය ඔවුන් ලබාදීමට පෙර, මෙම සියලුම වාර්තාවන් හැකි වහාම ප්‍රකාශයට පත්කර ජනගත කළ යුතුමය.

ගරු ජනාධිපතතුමනි, ඔබගේ වටිනා කාලය මේ සඳහා ලබා දීම පිළිබඳ අපි බෙහෙවින්ම ස්තූතිවන්ත වෙමු.

මෙම පෙත්සමෙහි නම් සඳහන් සියලු අය වෙනුවෙන් කැදවුම්කරු

කරුණාකර මෙම පෙත්සමෙහි අත්සන් තබන්නන්ගේ නම් කෙරෙහි අවධානය යොමු කරන්න.

**ගරු. වීරසිංහම් ආනන්ද සංගරී,** ශ්‍රී ලංකාව

(දෙමළ ජාතික සන්ධානයේ (ටී.යූ.එල්.එෆ්) සභාපති/ ලංකාවේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී සහ වර්තමාන නායක)

**මහාචාර්ය රජීව් විජේසිංහ**, කොළඹ, ශ්‍රී ලංකා

(එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ නියෝජිත/ සාම මහලේකම් කාර්යාලයේ හිටපු ප්‍රධානී)

**ආචාර්ය දයාන් ජයතිලක**, කොළඹ, ශ්‍රී ලංකාව

(හිටපු තානාපති/ පාර්ලිමේන්තුවෙන් පත් කළ ජිනීවා එක්සත් ජාතීන්ගේ සංවිධානය නියෝජිත/ හිටපු උප සභාපති එක්සත් ජාතික මානව හිමිකම් කවුන්සිලය/ ප්‍රංශය - හිටපු තානාපති සහ ස්ථිර නියෝජිත යුනෙස්කෝ)

**තමාරා කුනනයාගම්**, පැරිස් , ප්‍රංශය

(හිටපු තානාපති/ ජිනීවා එක්සත් ජාතීන්ගේ නියෝජිත)

**ක්‍රිස් ධර්මකීර්ති,** කොළඹ, ශ්‍රී ලංකාව

(ආර්ථික සංවර්ධනය පිළිබඳ ජාතික ජාතික කවුන්සිලයේ(එන්.සී.ඊ.ඩී.) හිටපු ප්‍රධානී/ නිව්යෝක්හි යූ.එන්.සී.එල්.ඕ.එස්. හි ප්‍රධානී)

**ආචාර්ය රනිල් සේනානායක**, කොළඹ, ශ්‍රී ලංකාව

(පරිසරවේදී, සහ යූඑන්.ඊ.පී නියෝජිත)

**ආචාර්ය එන්.පී. විජයානන්ද**

(නිව්යෝක්හි UNCLOS නියෝජිත/ භූවිද්‍යා සමීක්ෂණ හිටපු සභාපති)

**ආචාර්ය කුමාර් රූපසිංහ**, කොළඹ, ශ්‍රී ලංකාව

(මානව හිමිකම් ක්‍රියාකාරී සහ ගැටුම් නිරාකරණ විශේෂඥ)

**මේජර් ජෙනරාල් ලලින් ප්‍රනාන්දු**, කොළඹ, ශ්‍රී ලංකාව

(විශ්‍රාමික හමුදා නිළධාරී)

**කර්නල් අනිල් අමරසූරිය**, හෝමාගම, ශ්‍රී ලංකාව

(හමුදාවේ හිටපු නිළධාරී)

**චානක එල්ලාවෙල**, කොළඹ, ශ්‍රී ලංකාව

**ආචාර්ය ඊවාන් අමරසිංහ**, එක්සත් රාජධානිය

**ආචාර්ය අනුලා විජේසුන්දර** , කොළඹ, ශ්‍රී ලංකාව

**සුනිල් ජයතිලක**, කොළඹ, ශ්‍රී ලංකාව

**හසිනා ලීලාරත්න**, ලොස් ඇන්ජලීස්, ලොස් ඇන්ජලීස්, ඇමෙරිකා එක්සත් ජනපදය

**එච්.එල්.ඩී. මහින්දපාල**, ඔස්ට්‍රේලියාව

**අශෝක වීරසිංහ**, ඔටාවා, කැනඩාව

**ආචාර්ය ටී.එල්. ගුණවර්ධන**

(හිටපු ප්‍රවාහන අමාත්‍යාංශ ලේකම් සහ විශ්ව විද්‍යාල ශාස්ත්‍රඥ)

**අජන්ත ප්‍රේමරත්න**, ශ්‍රී ලංකාව

**එල්. වනසුන්දර**, ශ්‍රී ලංකාව

**මල් මුණසිංහ**, කැනඩාව

**රන්ජිත් සොයිසා**, වික්ටෝරියා, ඕස්ට්‍රේලියාව

**මහින්ද ගුණසේකර**, ටොරෙන්ටෝ, කැනඩාව

**සුරේන් රාගවන්**, ටොරෙන්ටෝ, කැනඩාව

**ගාමිණී ගුණවර්ධන**, ශ්‍රී ලංකාව

**චාර්ලස් පෙරේරා**, ශ්‍රී ලංකාව

**ඩේවිඩ් බ්ලාකර්**, ශ්‍රී ලංකාව

**සුරේන් රාධවන්,** ටොරෙන්ටෝ, කැනඩාව

**පිටපත් :-**

- ගරු අගමැතිතුමා
- ගරු විදේශ කටයුතු අමාත්‍යතුමා
- මැක්ස්වෙල් පරණගම මහතා

<u>එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය :-</u>

- සේයිඩ් රාඩ් හුසේන් - මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස්
- පබ්ලෝ ද ග්‍රීෆ් - the United Nations Special Rapporteur on Truth, Justice, Reparations and Guarantees of Non-Recurrence

<u>දරුස්මාන් කමිටුව :-</u>

- යස්මින් සූකා මහත්මිය

<u>එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් කවුන්සිලයේ 47 සාමාජිකයින්:-</u>

- ඇල්බනියාව, ඇල්ජේරියාව, ආර්ජෙන්ටිනාව, බන්ග්ලාදේශය, බොලිවියාව, බොට්ස්වානාව, බ්‍රසීලය, චීනය, කොන්ගෝව, කියුබාව, ඇල් සැල්වදෝරය, එස්ටෝනියාව, ඉතියෝපියාව, ප්‍රංශය, ගබොන්, ජර්මනිය, ඝානාව, ඉන්දියාව, ඉන්දුනීසියාව, අයර්ලන්තය, ජපානය, කසකස්ථානය, කෙන්යාව, ලැට්වියාව, මාලදිවයින, මෙක්සිකෝව, මොන්ටෙන්ගෝව, මොරොක්කෝව, නමීබියාව, නෙදර්ලන්තය, නයිජීරියාව, පකිස්ථානය, පැරගෝව, පෘතුගාලය, කටාර්, දකුණු කොරියාව, රුසියාව, සවුදි අරාබිය, සිරියා ලියෝන්, දකුණු අප්‍රිකාව, මැසඩෝනියාව, එක්සත් රාජධානිය, ඇමරිකා එක්සත් ජනපදය, එමීර් රාජ්‍යය, වෙනුසිලියාව, සහ වියට්නාමය.